GMOA
ESTABLISHED IN 1926
TU No. 291
THE GOVERNMENT MEDICAL OFFICERS' ASSOCIATION
No.275/75, Professional Centre, Prof. Stanley Wijesundara Mawatha, Colombo 07
Tel : 2580886 / 0714 999555
Fax : 4518668 / 2503586
Web : www.gmoa.lk
Email : info@gmoa.lk
office@gmoa.lk

13-08-2012

**මාධ්‍ය නිවේදනය**

**මාලබේ සිසුන් රැවටීමට තවත් ව්‍යාජ ලිපියක්**

මේ වන විට මාලබේහි වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම නමින් සිදු කරනු ලැබූ අසාර්ථක නියමු ව්‍යාපෘතියට අයත් වූ ආරම්භක කණ්ඩායම් වලට අයත් වූ සිසුන් විදෙස්ගතව හෝ තම අධ්‍යාපනය සිදුකර ගැනීමේ අවශ්‍යතාවයෙන් රට හැර යෑම අරඹා ඇත. මෙම සිසුන්ගේ ජිවිතයේ වසර තුනකුත්, අතිමහත් මුදල් සම්භාරයකුත් විනාශ කිරීමට වන්දි වශයෙන් මාලබේ මෙම පෞද්ගලික වෛද්‍ය උපාධි ආයතනය මගින් එම සිසුන්ට වන්දි ලබා දිය යුතු වූ නමුත් ඔවුන් තව දුරටත් මෙම සිසුන් හා දෙමාපියන් රැවටීමට ක්‍රියාකරණ බව පෙනී යයි.

ඒ ශ්‍රී ලංකාවේ වසර දෙකක අධ්‍යපනය පිලිගන්නා බවත් පිටරටදී එතැන් සිට අධ්‍යාපනය පිලිගන්නා බවටත් (Twin Programme )වටිනාකමකින් තොර කොල කැබැල්ලක් උසස් අධ්‍යාපන අමාත්‍යාංශය හරහා මෙම සිසුන්ට නිකුත් කිරීම මගිනි.

රටවල් දෙකක් සම්බන්ධ වී දෙනු ලබන (Twin Programme )වෛද්‍ය උපාධි ලංකාවේ වලංගු නොවන අතර ඉදිරියටද එම තත්ත්වය පවතිනු ඇත. එලෙසම උසස් අධ්‍යාපන අමාත්‍යාංශයට මෙලෙස ලිපියක් නිකුත් කිරීමට කිසිදු නෛතික බලයක් ද නැත.

විශ්වාස කටයුතු ආරංචි මාර්ග දක්වන පරිදි මෙ වන විට මෙවැනි ලිපියක් රුසියන් තානාපති කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් හෝ නිකුත් කරවා ගැනීමට දරණ ලද සියලුම උත්සාහයන් ව්‍යාර්ථ වීම නිසා මෙවැනි වංචාකාරී ක්‍රියා පිලිවෙතකින් මෙම සිසුන් රැවටීමට මෙම මාලබේ පිහිටි ආයතනය උත්සාහ කරන බව පෙනී යයි.

එලෙසම අලුතෙන් බඳවාගත් සිසුන් කණ්ඩායම් දෙකද ඉදිරියේදී මෙලෙසම වංචාවට හසුවීමට නියමිත අතර මෙම ප්‍රමිතියෙන් තොර වංචාකාරී ආයතනයේ ප්‍රචාරණ උපක්‍රමයන්ට නොරැවටෙන ලෙසත් තමන්ට වූ අසාධාරණයට හා වංචාවට නීතිමය පිලිසරණක් ලබා ගන්නා ලෙසත් මේ වන විට අධ්‍යාපනය කඩාකප්පල් වී ඇති සිසුන් කණ්ඩායම් 4න් සහ ඉදිරියට අධ්‍යාපනය විනාශ වීමට නියමිත කණ්ඩායම් දෙකෙන් අපි වගකීමෙන් යුතුව ඉල්ලා සිටිමු.

ස්තූතියි

වෛද්‍ය වන්දික එපිටකඩුව
ලේකම්

වැඩි විස්තර -

| | |
|---|---|
| වෛද්‍ය නාත් විජේසූරිය | 0714428322 |
| වෛද්‍ය නවීන් ද සොයිසා | 0718582444 |
| වෛද්‍ය නලින් ආරියරත්න | 0714800942 |